THE INSTITUTE OF CHARTERED ACCOUNTANTS OF SRI LANKA



# විධායක අදියර II

# KE 3 Fundamentals of Law

## (පෙරහුරු ප්‍රශ්න පත්‍රය)

**අපේක්ෂකයින් සඳහා උපදෙස්**

(1) ගත යුතු කාලය : කියවීම සහ සැලසුම් කිරීම - විනාඩි 10 යි
පිළිතුරු ලිවීම - විනාඩි 90 යි

(2) 1(a) කොටස : බහුවරණ ප්‍රශ්න (MCQ) දහයයි (10) . **සියලුම ප්‍රශ්න අනිවාර්යයි.**

1(b) කොටස : කෙටි පිළිතුරු අපේක්ෂිත ප්‍රශ්න පහයි (5). **සියලුම ප්‍රශ්න අනිවාර්යයි.**

2 කොටස : ප්‍රශ්න දෙකයි - **සියලුම ප්‍රශ්න අනිවාර්යයි.**

(3) සියලුම කොටස්වල ප්‍රශ්නවලට පිළිතුරු ඔබ වෙත සපයන පිළිතුරු පොතේ ලිවිය යුතුය.

1(a) කොටසට අදාළ පිළිතුරු ඔබ වෙත ලබා දෙන විශේෂ කඩදාසියෙහි සැපයිය යුතුය. වඩාත්ම ගැළපෙන පිළිතුර (අ,ආ,ඇ,ඈ) ද වශයෙන් තෝරා පිළිතුරු පත්‍රයේ අදාළ ප්‍රශ්න අංකය ඉදිරියෙන් දැක්විය යුතුය.

(4) 2 කොටසේ එක් එක් ප්‍රශ්න වලට අදාළ පිළිතුරු,පිළිතුරු පොතේ අලුත් පිටුවකින් ආරම්භ කරන්න.

(5) සියලුම පිළිතුරු **එක් භාෂාවකින්** සැපයිය යුතු අතර **එය අයදුම් කරන ලද භාෂා මාධ්‍යම විය යුතුය.**

K
E
3

## 1 කොටස

සියලුම ප්‍රශ්න අනිවාර්යයි.
1 කොටසට ලබා දෙන මුළු ලකුණු සංඛ්‍යාව 30 කි.
මෙම කොටසට නිර්දේශිත කාලය විනාඩි 54 කි.

## 1(a) කොටස

**01 ප්‍රශ්නය**

වඩාත්ම නිවැරදි පිළිතුර තෝරා ගැනීම ඔබගෙන් අපේක්ෂිතය

**(මුළු ලකුණු සංඛ්‍යාව 20 කි)**

1.1 පහත ප්‍රකාශ අතරින් නිවැරදි ප්‍රකාශය කුමක් ද?

අ. ශ්‍රී ලංකා ගිණුම්කරණ සහ විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලය පාලනය කිරීමේ කාර්යය ශ්‍රී ලංකාවේ වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනයට පවරා ඇත.

ආ. 1987 අංක 3 දරන පොදු ගිවිසුම් පිළිබඳ පනතේ විධි විධාන ක්‍රියාත්මක කිරීමේ කාර්යය සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවට පවරා ඇත.

ඇ. සුරැකුම්පත් සහ විනිමය කොමිසම (SEC) ශ්‍රී ලංකාවේ ප්‍රධානම ව්‍යාපාර වස්තු හුවමාරුවයි .

ඈ. ආයෝජන මණ්ඩලය (BOI) ස්ථාපිත කර ඇත්තේ 1953 අංක 24 දරන විනිමය පාලන පනතේ විධිවිධානයන්ට යටත්වය.

**(ලකුණු 2 යි )**

1.2 2006 අංක 5 දරන මුදල් විශුද්ධිකරණ පනතට අදාළව නිවැරදි වන්නේ පහත ප්‍රකාශවලින් කුමන එකද?

අ. පනතේ ප්‍රධාන අරමුණ වන්නේ ශ්‍රී ලංකාවේ මුදල් විශුද්ධිකරණය නියමානුකූල කිරීමයි.

ආ. මුදල් විශුද්ධිකරණය යනු හිමිකරුවාගේ මූලාශ්‍රයේ සත්‍ය අනන්‍යතාව සැඟවීමේ අරමුණින් සාපරාධී ලෙස රැස්කරන ලද අරමුදල්වල සංචලනයයි.

ඇ. මුදල් විශුද්ධිකරණය සඳහා ඇති එකම දඬුවම දඩයක් පැනවීමයි.

ඈ. මුදල් විශුද්ධිකරණය සිදු කිරීම වැළැක්වීම සඳහා ඇවිරීමේ නියෝගයක් (Freezing order) නිකුත් කළ හැක්කේ මහේස්ත්‍රාත්වරයෙකුට පමණි.

**(ලකුණු 2 යි)**

1.3 ගනුදෙනු කළහැකි ලියවිලිවලට අදාලව නිවැරදි වන්නේ පහත ප්‍රකාශවලින් කුමන එකද?

අ. විනිමය බිලක් යනු ලිඛිතව පවතින කොන්දේසිගත නියෝගයකි.

ආ. ගනුදෙනු කළහැකි ලියවිල්ලක් දරන්නෙකුට තමන්ගේ නමින් නඩු පැවරිය නොහැකිය.

ඇ. චෙක්පත් රේඛනය කරන්නේ එහි මුහුණත හරහා සමාන්තර රේඛා දෙකක් ඇඳීමෙනි.

ඈ. "ආදායකයා" යනු ගෙවීමට අණ දෙන්නාය.

**(ලකුණු 2 යි)**

1.4 විනිමය බිල් සහ චෙක්පත් සම්බන්ධව නිවැරදි වන්නේ පහත ප්‍රකාශවලින් කුමන එක ද?

අ. චෙක්පත් යනු ඉල්ලූවිට ගෙවිය යුතු බැංකු කරුවෙකුට එදිරිව පමණක් නිශ්චිතව ලියන විශේෂ ආකාරයක විනිමය බිලකි.

ආ. විනිමය බිලක් යනු නිශ්චිත මුදල් ප්‍රමාණයක් ගෙවීමට ඉල්ලන විට පමණක් නම් කරන ලද පාර්ශවයකට ගෙවීමට කරන ලිඛිත නියෝගයකි.

ඇ. විනිමය බිලක් යනු නිශ්චිත මුදල් ප්‍රමාණයක් නම් කරන ලද පාර්ශවයකට ගෙවීමට ඇති කර ගන්නා වාචික පොරොන්දුවක් විය හැකිය.

ඈ. චෙක්පතක් යනු නිශ්චිත මුදල් ප්‍රමාණයක් නම් කරන ලද පාර්ශවයකට නිශ්චිත දිනයක දී ගෙවීම සඳහා වන ලිඛිත පොරොන්දුවකි.

**(ලකුණු 2 යි)**

1.5 වාණිජ්‍ය නියෝජිතයා යන යෙදුම වඩාත් හොඳින් විස්තර කරන්නේ පහත ප්‍රකාශයන්ගෙන් කුමන එක ද?

අ. භාණ්ඩ මිල දී ගැනීම හෝ විකිණීමට තම ප්‍රධානියා බැඳී සිටින හෝ විකිණීම සඳහා භාණ්ඩ අනුප්‍රේෂණය කරන හෝ භාණ්ඩ ඇපයට තබමින් මුදල් රැස් කිරීමට බලය ඇති පුද්ගලයෙක්ය.

ආ. ප්‍රධානියාගේ භාණ්ඩ වෙන්දේසියක දී විකිණීමට පවරන පුද්ගලයෙක්ටය.

ඇ. ප්‍රධානියාගේ ප්‍රකාශිත බලය පිට නියෝජිතයෙක් ලෙස කටයුතු කරන පුද්ගලයෙක්ටය.

ඈ. ප්‍රධානියාගේ ප්‍රකාශිත හෝ විද්‍යාමාන බලය පිට නියෝජිතයෙකු ලෙස ක්‍රියා කරන පුද්ගලයෙක්ටය.

**(ලකුණු 2 යි)**

1.6 සුපිරි වෙළඳසැලට යන මීණා රුපියල් 2000 යනුවෙන් මිල සඳහන් ලේබලයක් සහිත රෙදි මැදීමට යොදාගන්නා කුඩා මේසයක් (ironing board) දකියි. මුදල් අයකැමි වෙත මේසය රැගෙන යන ඇය එහි මිල වශයෙන් රුපියල් 2000 ක් ගෙවීමට සැරසෙයි. එහෙත් මුදල් අයකැමි ඇයට පවසන්නේ ලේබලයේ සඳහන් මිල වැරදි බවත්, නිවරදි මිල රුපියල් 3000 ක් වන බවත් ය.

ගිවිසුමක් ප්‍රකාරව මිල ලේබලය විස්තර කෙරෙන්නේ පහත සඳහන් කවර ප්‍රකාශයද?

අ. අර්පණයක්

ආ. ප්‍රති - අර්පණයක්

ඇ. ගිවිසුමකට එළඹීම සඳහා කරන ඇරයුමක්

ඈ. ප්‍රතිග්‍රහණයක්

**(ලකුණු 02 යි)**

1.7 පහත ප්‍රකාශයන් 1983 අංක 12 දරන පාරිතෝෂික දීමනා ගෙවීම පිළිබඳ පනත සම්බන්ධව කළ ඒවාය.
එයින් නිවැරදි වන්නේ කවර ප්‍රකාශය ද?

අ. පනතින් ආවරණය වීම සඳහා සේවායෝජකයෙකුට අවම වශයෙන් සේවකයින් පස් දෙනෙකුවත් සිටිය යුතුය.

ආ. පාරිතෝෂිකයට හිමිකම් ලැබීමට සේවකයෙක් අවම වශයෙන් අවුරුදු දහයක්වත් එකම සේවා යෝජකයෙක් සමඟ සේවය කළ යුතුය.

ඇ. වංචාවක් හේතුවෙන් සේවකයෙකුගේ රැකියාව අවසන් කරනු ලබන අවස්ථාවක, සේවා යෝජකයාට අත් වූ පාඩුව සේවකයාගේ පාරිතෝෂික හිමිකම්වලින් අඩුකර ගත නොහැකි ය.

ඈ. දායක නොවන විශ්‍රාම වැටුප් ක්‍රමයක් යටතේ විශ්‍රාම වැටුපක් හිමි සේවකයින්ට පනත අදාළ නොවේ.

**(ලකුණු 02 යි)**

1.8 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනත යටතේ දායක මුදල් ගෙවිය යුත්තේ සේවකයාගේ ඉපයුම මත ය.

සේවක අර්ථසාධක අරමුදලේ දායක මුදල් ගනුදෙනුවේදී ඉපයුමක් ලෙස සලකන්නේ පහත සඳහන් ඒවායින් කුමන එක ද?

අ. අතිකාල ගෙවීම්

ආ. කුලී දීමනා

ඇ. ආහාර දීමනා

ඈ. ගමන් වියදම් ප්‍රතිපූර්ණය

**(ලකුණු 02 යි)**

1.9 වලංගු ගිවිසුමක අත්‍යවශ්‍ය අංගයක් නොවන්නේ පහත සඳහන් කොන්දේසි වලින් කවර එක ද?

අ. ගිවිසුම ලිඛිතව පැවතිය යුතු ය.

ආ. පාර්ශවවල අව්‍යාජ සහමතිය (කැමැත්ත) තිබිය යුතු ය.

ඇ. වලංගු අර්පණයක් තිබිය යුතු ය.

ඈ. නීතිමය වශයෙන් බැඳෙන සම්බන්ධතාවක් ඇති කිරීමට පාර්ශව අදහස් කළ යුතු ය.

**(ලකුණු 02 යි)**

1.10 නීතිය පිළිබඳ සාමාන්‍ය වර්ගීකරණය පවතින්නේ "පොදු නීතිය" සහ "පෞද්ගලික නීතිය" යනුවෙනි.

පහත සඳහන් නීති වලින් කුමක් "පෞද්ගලික නීතිය" යන විෂය පථයට ගැනෙයි ද?

අ. පවුල් නීතිය හා වාණිජ නීතිය

ආ. වාණිජ නීතිය හා අපරාධ නීතිය

ඇ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සහ දේපල නීතිය

ඈ. භාර නීතිය සහ පරිපාලන නීතිය

**(ලකුණු 02 යි)**

## 01 (b) කොටස

**02 ප්‍රශ්නය**

කාර්ය හඟවන ක්‍රියාපද (Action Verb Checklist) කෙරෙහි අවධානය යොමු කරමින් සියලුම ප්‍රශ්න වලට කෙටි පිළිතුරු සැපයිය යුතුය.

**(මුළු ලකුණු 10 යි)**

2. 1 එක්තරා කොන්දේසි සංඛ්‍යාවක් සැපිරීම මත උසාවිය සිරිතක් නීති මූලාශ්‍රයක් ලෙස හඳුනා ගනියි.
එවැනි කොන්දේසි දෙකක් (02) **සඳහන් කරන්න.**

**(ලකුණු 02 යි)**

2.2 අවශ්‍යතාවෙන් නියෝජ්‍යත්වයක් ඇතිකර ගැනීමේ දී සපුරාලිය යුතුව ඇති කොන්දේසි දෙකක් (02) **සඳහන් කරන්න.**

**(ලකුණු 02 යි)**

2.3 නියෝජිතයෙක් ඇතිකරගන්නා ගිවිසුමක් කෙරෙහි අපරානුමත කිරීම (Ratification) සඳහා කරන බලපෑම **පැහැදිලි කරන්න.**

**(ලකුණු 02 යි)**

2.4 ශ්‍රී ලංකාවට අදාළ වන හවුල් ව්‍යාපාර නීතිය යටතේ හවුල් ව්‍යාපාරයක් ඇති කර ගැනීම සඳහා සම්පූර්ණ කළ යුතු අවශ්‍යතා **ලැයිස්තු ගත කරන්න.**

**(ලකුණු 02 යි)**

2.5 ගිවිසුම් නීතියේදී ගිවිසුමකට එළඹීමට ඇරයුමක් යන්න විෂය පථයට ගැනෙන අවස්ථා දෙකක් (02) ක් **සඳහන් කරන්න.**

**(ලකුණු 02 යි)**

## 02 කොටස

| |
|---|
| සියලුම ප්‍රශ්න අනිවාර්යයි.<br>02 කොටස සඳහා ලැබෙන මුළු ලකුණු සංඛ්‍යාව 20 කි.<br>02 කොටසට නිර්දේශිත කාලය විනාඩි 36 කි. |

**03 වන ප්‍රශ්නය**

2016 ජනාවරි 01 : තම ඉඩම රුපියල් මිලියන තුනක මුදලකට විකිණීම සඳහා සුනී රුනීට අර්පණයක් කළේය. සුනීගේ අර්පණයේ පැහැදිළිව සඳහන් කර තිබුණේ එය 2016 ජනවාරි 10 දින හෝ එදිනට පෙර තැපෑලෙන් පමණක් ප්‍රතිග්‍රහණය කළ යුතු බවයි.

2016 ජනවාරි 08 : නිසියාකාරව මුද්දර අලවා ලිපිනය ලියන ලද සිය ප්‍රතිග්‍රහණ ලිපිය රුනී තැපැල් කළේ තැපැල් පෙට්ටියේ බහාලීමෙන් ය.

2016 ජනවාරි 09 : සිය ඉඩම නොවිකිණීමට තීරණය කළ සුනී තමන්ගේ අර්පණය අවලංගු කරන බව රුනීට දුරකතනයෙන් දැන්වීය.

| |
|---|
| **අවශ්‍ය වන්නේ :**<br>**පැහැදිලි කරන්න.**<br>(අ). තැපෑලෙන් ප්‍රතිග්‍රහණයට අදාළ නීතිමය මූලධර්ම<br>**(ලකුණු 03 යි)**<br>(ආ). ගිවිසුමක් අවලංගු කිරීමට අදාළ නීතිමය මූලධර්ම<br>**(ලකුණු 03 යි)**<br>(ඇ). සුනී හා රුනී අතර වලංගු ගිවිසුමක් ඇති වී තිබෙනවාද යන්න<br>**(ලකුණු 04 යි)**<br>**(මුළු ලකුණු 10 යි)** |

04 වන ප්‍රශ්නය

කඩ හිමියෙකු වන අමල් තොග වෙළෙන්දෙක් වන කමල්ගෙන් ලබාගත් රතු බාස්මතී සහල් සාම්පලයක් පරීක්‍ෂා කර බැලුවේය.

පරීක්ෂණයේ ප්‍රතිඵල වලින් තෘප්තිමත් වූ අමල් කමල්ගෙන් රතු බාස්මතී සහල් මලු 100 ක් මිලදී ගත්තේ ය.

අනතුරුව ගයානි රතු සහල් බෑගයක් අමල්ගේ කඩයෙන් මිලදී ගත්තේ ය.

නිවසට ගොස් සහල් බෑගයක් විවෘත කළ විට රතු බාස්මතී සහල් වලට රතු පරිප්පු මිශ්‍රව ඇති බව ඇයට පෙනිණ.

**අවශ්‍ය වන්නේ :**

(අ). (i) ගැනුම්කරුවෙකු වශයෙන් ගයානිගේත් **(ලකුණු 03 යි)**
(ii) ගැනුම්කරුවෙකු වශයෙන් අමල්ගේත් **(ලකුණු 03 යි)**

දෘෂ්ටිකෝණ වලින් මෙම සිද්ධියට අදාළ වන නීතිමය මූලධර්ම භාණ්ඩ විකිණීම පිළිබඳ ආඥා පනත යටතේ **පැහැදිලි කරන්න.**

(ආ). දී ඇති සිද්ධියට අදාළව භාණ්ඩ විකිණීම පිළිබඳ ආඥා පනත යටතේ ගයානි සහ අමල් යන දෙදෙනාටම ලබාගත හැකි ප්‍රතිකර්ම **හඳුනා ගන්න.**

**(ලකුණු 04 යි)**

**(මුළු ලකුණු 10 යි)**